# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2014

## Primary Piriven Mid Year Term Test - 2014

4 වසර / Grade 4

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**සිංහල**
**Sinhala**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ I කොටසේ ප්‍රශ්න දෙකට ද, II කොටසින් එක් ප්‍රශ්නයක් ද, III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

### I කොටස

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න.

i. අනගාරිකධර්මපාල තුමා

ii. පතින්ට පෙර සිතා බලනු

iii. පරිසරය මිනිසාගේ ජීවය යි.

iv. පන්සිල් සුරකින සමාජයක් ගොඩනගමු.

v. පරසතුරු ආක්‍රමණවලින් රට බේරා ගත් අපගේ ජාතික වීරයෝ (ලකුණු 25)

02. පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස්වල අදහස ලිහිල් බසින් ලියන්න.

(අ) "තමන්වහන්සේට අනුව ශ්‍රී මුඛ පාලි සඟි අටුවාදිය තෝරා කීමෙහි අභිනව ප්‍රබන්ධ ඉපදවීමෙහි රාජ රාජ මහාමාත්‍ය මහාස්ථවිරාදි මහ පිරිස් මැද සභාරඤ්ජනය කොට ධර්ම කථනයෙහි බුහුටි කරවූ තමන්වහන්සේගේ ශිෂ්‍ය සමාගමට ප්‍රධාන වූ සාධාරණ ගුණ නුවණ යහපත් ගති ඇති පොල්පිටිගම සිද්ධාර්ථ ශිෂ්‍ය වූ උන්නාන්සේට යථෝක්ත පොත් හා ශිෂ්‍ය සමාගමත්, රිදී විහාරයත්, රක්ෂාකරගෙන සිටින ලෙසට සාධාරණ ගුණ නුවණ කියා කර සොඳින් දෙමින් නිමවා........" (ලකුණු 15)

(ආ)
දියෙහි යන දණ්ඩ ට
පිහිටක් වෙතත් පෙර සි ට
දුදනන් හට පිහි ට
නොවච් යන බස සැබෑ කෙලෙ ම ට

කොපමණ ගුණ කළත්
දුදනෝ නොවෙති යහපත්
කිරි දියෙනි දෙවියත්
අඟුරු සුදුවන කලෙක් නම් නැත්

දුරුකර හිරි ඔතප්
පෙන්විය දුදන ගුණ ගැප්
මොහුට අප දුන් සිප්
පෙවූ කිරි වැන්න විස ගොර සප් (ලකුණු 15)

## II කොටස

03. (අ) පහත සඳහන් සන්ධි පද විසන්ධි කර දක්වා, සන්ධි නාමය සඳහන් කරන්න.

**පිනැති , බුත්සරණ , ශාලාධිපති , කාලෝචිත , ගෙවුයන්** (ලකුණු 05)

(ආ) පහත සඳහන් පද සදොස් නම් නිදොස් කොට ලියන්න.

**ඓෙතිහාසික , ඖෂධාලය , ප්‍රශ්ණය , සම්ප්‍රධාය , පරිසංණකය** (ලකුණු 05)

(ඇ) පහත ඉරි ඇඳි පදවල විභක්ති නාමය දක්වන්න.

i. <u>ගසින්</u> ගෙඩි වැටේ.

ii. <u>රටේ</u> සම්පත් විනාශ නොකරමු.

iii. මී මැස්සෝ <u>මල්වල</u> පැණි බොති.

iv. <u>සිත්තරුන් විසින්</u> බිතුසිතුවම් නිමවන ලදී.

v. අපි <u>අසරණයන්ට</u> හැකි අයුරින් පිහිට වෙමු. (ලකුණු 05)

04. (අ) පහත සඳහන් කෘදන්ත පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.

**බැලූ , ලියුම් , කියමන් , සිඟමන් , නෙළූ** (ලකුණු 05)

(ආ) පහත සඳහන් තද්ධිත පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.

**කනිෂ්ඨ , කැඳිත්තක් , පියාණෝ , සිරිමත් , දේශීය** (ලකුණු 05)

(ඇ) මුලින් දී ඇති සමාස වර්ගයට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. අව්‍යය සමාසය ( සුමුදු , මනහර , රටතොට , නිලධාරී )

ii. විශේෂණ සමාසය ( උපගුරු , වනමල් , පන්සිල් , පින්වත් )

iii. විභක්ති සමාසය ( මුහුදු සුළං , යාවජීව , නිලුපුල් , සුරාසුර )

iv. අන්‍යාර්ථ සමාසය ( බලමුළු , වැඩබිම , දසබල , උපකරණ )

v. ද්වන්ද්ව... දකාරාර්ථ සමාසය ( ගිහි පැවිදි , සුදුරෙද්ද , සොරබිය , අකුසල් )

(ලකුණු 05)

05. (අ) පහත සඳහන් වාක්‍ය කර්තෘ කාරකයට නගන්න.

i. ඔවුන් විසින් අපි ඇමතෙමු.

ii. මා විසින් ඒ පුවත අසන ලදී.

iii. අමුත්තා විසින් පොල්තෙල් පහන දැල්විණි.

iv. දෙගුරුන් විසින් දරුවෝ රැකෙති.

v. වැද්දන් විසින් සත්තු දඩයම් කරණු ලැබෙති. (ලකුණු 05)

(ආ) පහත සඳහන් සමාස පද යොදා අර්ථවත් වාක්‍ය නිර්මාණය කරන්න.

**විදේශාධාර , ගම්නියම්ගම් , සහසකර , චතුසුද්ද , කහකුරුල්ලා**

(ලකුණු 05)

(ඇ) පහත සඳහන් පාඨවල විධි ක්‍රියා තෝරා ලියන්න.

i. එන්න මද නලේ - ගොස් පවසන්න දූක මගේ

ii. බල සුබ නිමිති පෙරමග නැකතටත් වැඩී

iii. වඩිනු මැනවි පා සළඹ සලා

iv. තැන තැන මුවරළ දැක යව සතොසා

v. බල ගඟ දිය කෙළනා ලිය සසොබා (ලකුණු 05)

## III කොටස

06. මෙතෙක් ඉගෙන ගත් පද්‍ය ඇසුරින් ගුත්තිල කාව්‍යයේ ඔබ සිත්ගත් වැනුමක් පිළිබඳව ඇගයීමක් කරන්න. (ලකුණු 15)

07. විජයබාකොල්ලය ඓතිහාසික නවකතාවක් ලෙස සාර්ථක වීමට කතුවරයා තෝරා ගත් කතා පුවත කොතෙක් දුරට හේතු වී ඇද්දැයි විමසන්න. (ලකුණු 15)

08. "සංඝරාජ සාධුචර්යාව තුළින් මහනුවර යුගයේ භික්ෂු සමාජයේ ස්වභාවය ඉස්මතු ව පෙනේ." පැහැදිලි කරන්න. (ලකුණු 15)

මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2014

Primary Piriven Year End Term Test - 2014

4 වසර / Grade 4

**සිංහල**
**Sinhala**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ I කොටසේ ප්‍රශ්න දෙකට ද, II කොටසින් එක් ප්‍රශ්නයක් ද, III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරා ගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

## I කොටස

01. (අ) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න.

i. උත්සාහයෙන් ජය ලබමු.
ii. පන්සල සමාජසේවා මධ්‍යස්ථානයක් ලෙස.
iii. රටක සංවර්ධන ඉලක්ක ඉදිරියේ ඇති අභියෝග
iv. සිංහල උපදේශ කාව්‍ය
v. භික්ෂූන් වහන්සේ සතු වර්තමාන සමාජ මෙහෙවර (ලකුණු 25)

(ආ) පහත සඳහන් ඡේදය ⅓ ක් වන සේ සාරාංශ කරන්න.

එක් රමණීය උදෑසනක කුරුල්ලන් අතුපතර නාද දෙද්දී පාන්දරින් ම අවදි වූ මහල්ලා රෝදයක් ගෙන නගරයෙන් මදක් ඈතින් වූ ගම්බද පෙදෙසකට ගියේ ය. එහි ගොස් පැරණි ගසින් හා කටු පඳුරින් යුතු වන ලැහැබක් මැදින් ගමන් කළ ඔහු වරින් වර කැස්සේය. ගොරෝසු ගැට සහිත පොත්තෙන් වැසුණු මහා ගස්වල නිහඬ බව ඔහුට තේරුන් ගත නොහැකි විය. ශාන්ත උදයේ පැවති මීදුම ගස් අතරින් පොළොවට ගලා එන්නට විය.

(ලකුණු 10)

02. පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස්වල අදහස ලිහිල් බසින් ලියන්න.

(අ) ඉන්පසු උපාලි මහා ස්ථවිර සාමීන්ට කර්ණ රෝගාදී ගිලන්ගති වැඩිවෙමින් යන ප්‍රස්ථාවට නැවතත් එම සියම් දෙසින් ම ලංකාවේ නැති පොත් පත් සමඟ රාජපණ්ණාකාර යුවරාජ පණ්ණාකාර සංඝරාජ පණ්ණාකාරත් පිටත්කර එවමින් ස්‍යාමින්ද්‍ර දේශාධිපති ධාර්මික මහා රාජෝත්තමයාණෝත් ශ්‍රී රාජසිංහ අප මහා රාජෝත්තමයාණෝත් ක්ෂිරෝදකය මෙන් ඒක ස්වභාවයෙන් අදිෂ්ටමිත්‍රව වසනුවෝ විදර්ශනාධූරාචාරී වූ විසුද්ධාචාරීන් වහන්සේ ද ග්‍රන්ථධූරාචාරී වූ වරඤාණ මහා ස්ථවිර ස්වාමීන්ද්‍ර ප්‍රමුඛ කම්මාවාචා උන්නාන්සේලා ද දෙවනිවාරෙත් ලංකාවට එවමින් ප්‍රථමවාරෙත් වැඩිය උපාලි මහා ස්ථවිර සාමීන් විසින් මහණ මහලු පැවිදි කරවමින් හික්මවන ලද............ (ලකුණු 10)

(ආ) සඳවා සුදු වැලි පිවිතුරු
බඳවා රන් දද පියකරු
සිටුවා දොර දොර රඹතුරු
තබවා පුන් කුඹු විසිතුරු

සරා සළෙලු දන සතොසේ
සුරා පාන කරන ලෙසේ
පුරා අවුලු නොයෙක රසේ
සරා අවන්හල සහසේ

(ලකුණු 15)

## II කොටස

03. (අ) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

i. අනුසාසනාව / අනුශාසනාව / අනුෂාසනාව
ii. අධික්සනය / අධීක්ෂණය / අදීක්ෂණය
iii. මර්ධනය / මර්දණය / මර්දනය
iv. සංශ්ලේශනය / සංශ්ලේෂණය / සංෂ්ලේශනය
v. ගුණානුස්මරණය / ගුනානුස්මරණය / ගුණානුස්මරනය (ලකුණු 05)

(ආ) පහත සඳහන් විසන්ධි පද සන්ධි කර දක්වන්න.

i. සුවඳ + ඇති ii. උපන් + උපන් iii. දෙ + ඇඟිලි
iv. අත් + සන v. ගඟ + දිය (ලකුණු 05)

(ඇ) පහත සඳහන් සමාස පද 05 යොදා අර්ථවත් වාක්‍ය 05 ක් නිර්මාණය කරන්න.

i. විදේශාධාර ii. සහසැස් iii. පොත්පත් iv. සතුරුබිය v. අකුසල්
(ලකුණු 05)

04. (අ) පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට නගන්න.

i. නවකථාකරුවෝ අප විවේචනය කරති.
ii. විද්‍යාචක්‍රවර්තිහු බුත්සරණ ලියූහ.
iii. ආණ්ඩුකාරයා ඇමතිවරියක පත් කරයි.
iv. පැරණි සිත්තරු ජාතක කථා සිතුවමට නැගූහ.
v. විදුහල්පති ශිෂ්‍ය නායිකාවක පත් කළේය.

(ලකුණු 05)

(ආ) පහත සඳහන් කෘදන්ත පදවල ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.

i. නැටුම් ii. සැරසිලි iii. බබලන iv. මැරුණු v. බලනු

(ලකුණු 05)

(ඇ) පහත සඳහන් අර්ථ ප්‍රකාශ කිරීම සඳහා තද්ධිත නාම දක්වන්න.

i. ඉසුරු ඇත්තේ ii. නැකත් දන්නේ iii. දහම් හි හැසිරෙන්නේ

iv. විශේෂ බව v. දැවයෙන් නිපදවන ලද

(ලකුණු 05)

05. (අ) සිංහල විෂය සඳහා රජයෙන් ප්‍රකාශිත පිරිවෙන් පංති පොත් ප්‍රමාණවත්ව නොලැබීම නිසා සිදුව ඇති අපහසුතා දන්වමින් කඩිනමින් එම පොත්පත් ලබා දෙන ලෙස ඉල්ලමින් අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්තුමා වෙත යැවෙන ලිපියක් ලියන්න. (ලකුණු 10)

(ආ) අදාළ ලිපිය ලියාපදිංචි තැපෑලෙන් යැවීම සඳහා ලියුම් කවරයක් ද ලියන්න.

(ලකුණු 05)

## III කොටස

06. ගුත්තිල කාව්‍යය කෝට්ටේ යුගයේ රචනා වූ සෙසු පද්‍ය කාව්‍ය අතරින් විශිෂ්ට නිර්මාණයක් ලෙස සැලකීමට හේතු උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 15)

07. ඓතිහාසික කථාපුවතක් නවකථාවක් සඳහා පාදක කර ගැනීම කෙතෙක් දුරට සාර්ථක වී ඇද්ද යන්න විජයබාකොල්ලය නවකථාව ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

08. "පිරිහෙමින් පැවති බුද්ධ ශාසනය නැවත නගා සිටුවීමෙහිලා සරණංකර සංඝරාජ හිමි දැරූ ප්‍රයත්නය සංඝරාජ සාධු චර්යාව තුළින් පෙනේ." පැහැදිලි කරන්න. (ලකුණු 15)